සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone

දෙවන වාර ඇගයීම - 2025
Second Term Evaluation - 2025

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 10 | විෂයය Subject: සිංහල භාෂාව හා සාහිත්‍ය I | කාලය Time: පැය 01 |

## I කොටස

- **අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි ඉරි ඇඳි කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.**

01. ඔහුගේ සිරිත **කරබාගෙන** සිටීම බව කවුරුත් දනිති.
    1. කරෙන් බාගෙන සිටීම. 2. නිශ්ශබ්දව සිටීම.
    3. අවධියෙන් සිටීම. 4. කල්පනාවෙන් සිටීම.

02. ක්‍රමක් ක්‍රමයෙන් **කැලෑ නීතිය** හිස ඔසවතැ'යි ඔවුහු පවසති.
    1. දුබලයා දුබලයා පෙළීම. 2. දුබලයා බලවතා පෙළීම.
    3. බලවතා දුබලයා පෙළීම. 4. බලවතා බලවතා පෙළීම.

03. රියදුරුගේ රිය ධාවනය නිසා **ඇගේ ලේ වතුර වුණා** යැයි මගීහු පැවසූහ.
    1. ඇගේ ලේ වතුර වූ බව 2. දැඩි කෝපයට පත්වූ බව
    3. ඇගේ ලේ රත් වූ බව 4. දැඩි භීතියට පත් වූ බව

- **අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන් වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

04. පියාගේ රැකියාව අහිමි වීම තම ................ බාධාවක් නොවන බව ඔහු නිරන්තරයෙන් පවසයි.
    1. පරාදීනත්වයට 2. ගැති බවට 3. ස්වාධීනත්වයට 4. පරගැති බවට

05. දුටුගැමුණු කාලයේදී ................ ගණනාවකින් සැදුණු අනුරාධපුර මහා විහාරය ජනප්‍රියය.
    1. ප්‍රසාද 2. වාසස්ථාන 3. කාමර 4. නිවහල්

06. තම දරුවාගේ වියෝව ඇයට බෙහෙවින්ම ................ සිතුවිල්ලක් වූවාය.
    1. ආවේගකාරී 2. වේදනාකාරී 3. විනාශකාරී 4. ප්‍රයෝගකාරී

07. සෑම පදයකම පදවල අක්ෂර වින්‍යාසය නිවැරැදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
    1. සණ්ඨාර, කණ්ඨජ, කණ්ණාඩිය, බ්‍රැන්ඩි
    2. ආරෝහණ, විභීෂණ, පන්ථක, සන්තක
    3. ප්‍රශ්නය, ශාසනය, දේශණය, විකාශනය
    4. උෂ්ණය, කර්නය, මිනිරන්, ළපටි

08. කෙටි පාපිල්ල, කෙටි ඇදපිල්ල , කෙටි ඇලපිල්ල , කෙටි ඉස්පිල්ල මධ්‍යයෙහි ඇති පිල්ලම් අනුපිළිවෙළින් යෙදී ඇති වචන දැක්වෙන වරණය තෝරන්න.
    1. අටුව, කටුව, රාවණා, අනුලා 2. කුසුම, රැහැන, වාහන, වැතිර
    3. පුටුව, කැහැටු, නාවාන, වැනිලා 4. රුවල, පුවල, සුසාන, කිනිසි

09. ''**අමර**'' යන පදයෙහි අන්තර්ගත අකුරු උපදින ස්ථාන පිළිවෙළින් වනුයේ,

1. කණ්ඨජ, තාලුජ, මූර්ධජ    2. කණ්ඨජ, දන්තජ, ඕෂ්ඨජ
3. කණ්ඨජ, තාලුජ, ඕෂ්ඨජ    4. කණ්ඨජ, ඕෂ්ඨජ, මූර්ධජ

10. අකාරාදී පිළිවෙළ නිවැරදිව දැක්වෙන පද පේළිය තෝරන්න.

1. වාලුකාංග, බෝධිඝර, හත්ථිපාකාර, පටිමාඝර
2. පටිමාඝර, බෝධිඝර, වාලුකාංග, හත්ථිපාකාර
3. අංගනය, වාලුකාංග, පටිමාඝර, බෝධිඝර
4. අංගනය, බෝධිඝර, පටිමාඝර, වාලුකාංග

11. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

1. සේකරයන්, ශිල්පියෙක්, ඔවුන්, මිනිසුන්
2. ඔබ, අප, කුරුල්ලන්, තාරකා
3. අයෙක්, ඇතමෙක්, කෙනෙක්, සමහරෙක්
4. කුමාරිකාවක, බුද්ධිමතුන්, මං තනන්නන්, මා

12. මිනිසා, කුරුල්ලෝ, සත්තු, පොත යන නාම පදවල නිවැරදිව නාම ප්‍රකෘතිය අයත් වන්නේ,

1. මිනිසා, කුරුල්ලා, සතුන්, පොත්    2. මිනිස්, කුරුල්ලන්, සතුන්, පොත
3. මිනිසා, කුරුලු, සත්තු, පොත    4. මිනිස්, කුරුලු, සත්තු, පොත්

13. ''අතු කඩා ................. කන්නා සේ'' ප්‍රස්තාව පිරුළ නිවැරදිව සම්පූර්ණ වන්නේ,

1. අඹ    2. ජම්බු    3. මොර    4. කෝන්

14. විරුද්ධාර්ථයක් දෙන යුගල පදයක් සහිත වරණය කෝරන්න.

1. තැගි - භෝග, අවි - ආයුධ    2. උදවු - පදවු, ඉඳුම් - හිටුම්
3. ඉහින් - කනින්, ගනු - දෙනු    4. ගමේ - ගොඩේ, අරුම - පුදුම

15. අනියමාර්ථ අසම්භාව්‍ය ක්‍රියාවක් සහිත වාක්‍ය තොරන්න.

1. වැසි වැස්සොත් ගඟ පිරෙයි.    2. සුළං හමද්දී ගස වැටුණෝය.
3. සින්දු කියමින් නැටුවේය.    4. ගාට ගාට ඇවිදින් නොපෙනී ගියේය.

16. වර්තමාන කාල ප්‍රථම පුරුෂ බහු වචන උක්ත පදයක් හා අනුක්ත පදයක් සහිත වරණය තෝරන්න.

1. වෙළෙන්දෝ - නාගරිකයන්    2. ඔවුන් - තොප
3. තරුණයෝ - ඔවුහු    4. වෛද්‍යවරුන් - වනිතාවන්

17. ප්‍රයෝජ්‍ය ක්‍රියාවක් යෙදී ඇති වාක්‍ය කුමක්ද ?

1. නැගණිය මල් කඩා බුදුන් වැන්දාය.
2. වෛද්‍යවරු වැඩ වැරීමට සූදානම් වෙති.
3. දේශපාලඥයෝ කුලීකරුවන් ලවා හිංසා කරවති.
4. ඔවුන් අනුගමනය කළොත්, දුසිරිතෙන් වැළකිය හැක.

- **අංක 18 හා 19 දක්වා ප්‍රශ්නවල ඉරි ඇඳි කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.**

18. කෙටි කතා කරුවාගේ **ප්‍රතිභාව** ප්‍රශංසනීය ය.

1. නැවත නැවත සැකසීමේ හැකියාව
2. සිතාමතා කටයුතු කිරීමේ හැකියාව
3. අපූර්ව වස්තුවක් නිර්මාණය කිරීමේ හැකියාව
4. විශ්වසනීයත්වය ප්‍රකට කිරීමේ හැකියාව

19. ඔහු **පරිකල්පනය** මගින් ගොඩ නැගූ යථාර්ථය නිර්මාණයේ අන්තර්ගත වෙයි.

1. මතුපිට අර්ථය ඉක්මවා යන අර්ථය    2. තැනට හා අවස්ථාවට ගැළපෙන
3. පුදුම උපදවන සුළු    4. යමක් සිතින් මවා ගැනීම.

20. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමඟ බැඳී නොපවත්නා පද පේළිය තෝරන්න.

1. ගෙදර, කාමර, සාලය, කුස්සිය
2. රාජාලියා, උකුස්සා, කුරුලු ගොයා, මයිනා
3. අල, බතල, මඤ්ඤොක්කා, හිඟුරල
4. සීනි, තේ, පිටි කිරි, උණු වතුර

21. එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් ඇති වරණය තෝරන්න.

1. සඳ, හිමකර, තරිඳු, නිශාකර
2. සතුට, සතොස, ආනන්දය, පාදප
3. වනය, අරණ, බිල, බැද්ද
4. රන්, ස්වර්ණ, කසුන්, නිමල්, කනක

22. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

1. ප්‍රසිද්ධ, පුවතර, පසිඳු, ප්‍රකට
2. මුහුද, සයුර, සාගරය, රුවනාර
3. ගස, රුක, වෘක්ෂය, බැද්ද
4. ජලය, වතුර, පැන්, අඹ

- **අංක 23 සිට 24 දක්වා ප්‍රශ්න සඳහා වැරදි අදහස දෙන පිළිතුර තෝරන්න.**

23. 
1. සිදත් සඟරා හෝඩියේ අකුරු 30 කි.
2. අමිශ්‍ර සිංහල හෝඩිය, ශුද්ධ සිංහල හෝඩිය යනුවෙන් ද හඳුන්වයි.
3. සාම්ප්‍රදායික මිශ්‍ර සිංහල හෝඩියේ අකුරු 54 කි.
4. නූතන මිශ්‍ර සිංහල හෝඩියේ අකුරු 61 කි.

24. 
1. සිංහල අක්ෂර මාලවේ ස්වර අකුරු 18 කි.
2. 'පිළිකුරු' යනුද ස්වර හඳුන්වන නමකි.
3. මාත්‍රා දෙකකින් උච්චාරණය කරන අකුරු හ්‍රස්ව අකුරුයි.
4. සිංහලයේ වර්ග අක්ෂර 25 කි.

25. පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැලපීමෙන් යුක්ත අර්ථාන්විත වාක්‍යය තෝරන්න.

1. අක්ෂර මාලාව හැඳින්වීම සඳහා යෙදෙන නමක් අකාරාදිය නොවේ.
2. අක්ෂර මාලාව යනු, සිංහල භාෂාවේ සියලුම ශබ්ද ලියා දක්වන සංකේත සමූහයයි.
3. ඌෂ්මාක්ෂර එකක් පමණක් වචන යෙදුණ පේළිය නොවේ.
4. අනුස්වාරය සහිත වචන විසර්ගය සහිත වචන ද වේ.

- **අංක 26, 27 ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.**

26. විශාල බලාපොරොත්තුවක් ඇතිව සිටියද ප්‍රතිඵලය අල්පවීම.
1. කලකදි වහලු කලකදි රස වෙනවාලු
2. හිසරදයට කොට්ටේ මාරු කරන්නා සේ
3. පුංචි අම්මාත් ඇවිත් කැවුම් පුංචි කලා වගේ.
4. එපා වාහෙට හොදි බෙදන්නා වගේ

27. අගයක් නොමැතිවීම.

1. කැලේට පායපු හඳ වගේ
2. උඩින් මිතුරු යටින් හතුරු
3. දී කිරට බලල්ලුත් සාක්කිලු
4. එළ හරකයි මී හරකයි එකට ඇඳුවා වගේ

28. පූර්වස්වර ලෝප සන්ධියට හා පරස්වර ලෝප සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන්නේ,

1. දකුණත - ගුරුතුමා
2. කම්මල - කොග්ගල
3. ගිනියම් - අත්‍යවශ්‍ය
4. ළිං පඩිය - මැදැගිල්ල

- **අංක 29 සිට 32 තෙක් ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.**

29. 1. තුඹලා අනාගත නායකයන් වෙහු. 2. අපි සියල්ලන්ම ශ්‍රී ලාංකිකයෝ වෙමු.
3. අශෝක රජතුමා දැහැමි පාලකයෙක්ද? 4. ජෝර්ජ් කීට් විදග්ධ චිත්‍ර ශිල්පියෙකු වෙයි

30. 1. අහසේ තාරකා බබළති. 2. ගස් පෙළ සුළඟින් ඉදිරී වැටුණහ.
3. මිනිසුන් අදහස් දක්වති. 4. නිල් වළාවෝ ඈතට ඇදෙති.

31. 1. සිසුහු පන්තියට පැමිණ නැත.
2. ඔවුහු එය වටහා ගැනීම යෙහෙකි.
3. පයින් යන්නෝ පාරේ දකුණින් යා යුත්තාහ.
4. සියලු මිනිස්සු සත්‍ය ගරුක විය යුතුය.

32. 1. දක්ෂ ක්‍රීඩිකාවක වන්නේ කෙසේද ? 2. අපි සාමය ළඟා කර ගන්නේ කවදාද ?
3. අපි ගිලනුන්ට උවටැන් කරනු වටී. 4. ඕ තොමෝ ගමට ගියහ.

33. ''මාණික්‍ය සේ පොළෝ ගැබේ නිධාන වී
ඇත්තේ ඒ අතීත දූ පුතුන් .....'' මෙහි විද්‍යමාන වනුයේ,

1. උපමාවකි 2. අතිශයෝක්තියකි
3. රූපකයකි 4. ස්වභාවෝක්තියකි

34. 'හඳ සහ නිව්යෝක් නුවර' කවි පෙළෙහි රචකයා වන්නේ,

1. මහගම සේකර මහතා ය. 2. ගුණදාස අමරසේකර මහතා ය.
3. ඒ.වී. සුරවීර මහතා ය. 4. රත්න ශ්‍රී විජේසිංහ මහතා ය.

35. 'පිරුවානා පොත් වහන්සේ
කනප්පුවේ පෙරලී ඇත....' මෙම නිර්මාණයේ කතුවරයා වනුයේ,

1. විමල් දිසානායක මහතා ය. 2. ඒ.වී. සුරවීර මහතා ය.
3. ගුණදාස අමරසේකර මහතා ය. 4. එච්.එම්. කුඩලිගම මහතා ය.

36. 'විජය බා කොල්ලය, සඳා මෙලෙස පුර දෙරණේ' යන නිර්මාණවල කතුවරුන් වන්නේ,

1. ඒ.වී. සුරවීර - රුවන් බන්දුජීව 2. ඩබ්.ඒ. සිල්වා - ඒ.වී සුරවීර
3. ඩබ්.ඒ. සිල්වා - පරාක්‍රම කොඩිතුවක්කු 4. ඒ.වී. සුරවීර - පරාක්‍රම කොඩිතුවක්කු

37. පහත කාව්‍ය නිර්මාණය නිවැරදිව සම්පූර්ණ වන වරණය තෝරන්න.

''ඉහළ වෙලේ ඉස්මත්තේ
.......................................
නීල වරල ළැමැද හෙලාලා
බිමට නැමී ඔය කවුදෝ.......''

1. පහළ වෙලේ යට පැත්තේ 2. දිය හබරල මල් ගොල්ලේ
3. පහළ විලේ යටි පැත්තේ 4. අහළ පහළ වල්ගොල්ලේ

38. මොනරාගල ප්‍රාදේශීය ව්‍යවහාරයේ යෙදෙන 'මං එද්දිං යාකොය්' යන්නෙහි අදහස වන්නේ,

1. මා එනවිට සිදුවූයේ කුමක්ද ? 2. මා එද්දි කොහේද ? ගියේ.
3. මම එනකන් යන්න. 4. මා එද්දි යනවද ?

39. ''බොරලු පොළොවනේ.... වහින කාලෙට හොඳටම බුරුල්. පායන කාලෙට හොඳට ම තදයි''
මේ පාඨය අන්තර්ගත වන කෘතිය කුමක්දැයි තෝරන්න.

1. සුනේත්‍රා 2. මං තනන්නෝ
3. විජය බා කොල්ලය 4. ලක්බිම වන සැරිය

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.

තණපත් අතර පිපි කුසුමින් මකරන්දය උරාගෙන තණබිම් හරහා යන මඳ සුළඟේ පහස විඳීමට ඔබටත් හැකිවනු නොඅනුමානය.

1. තණපත් අතර පිපුණු මලින් බමරු රොන් උරා බොති.
2. පිපුණු මලින් හමන සුවඳ උරාගත් සුළගේ පහස විඳීමට ඔබට ද හැකිවනු ඇත.
3. තණ බිම් හරහා හමන මඳ සුළඟින් ගත සිත පින වේ.
4. තණ බිම් අතර පිපුණු මල් මකරන්දයේ පහස විඳීමට හැකිවනු ඇත.